# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2402/21 - 2024 සැප්තැම්බර් මස 21 වැනි සෙනසුරාදා - 2024.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මඟින් -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2024.09.13 දිනැති අංක 24/1923/631/050 දරන තීරණය මඟින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවට;

(ආ) ඒ ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවට;

(ඇ) පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවට; සහ

(ඈ) නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවල දී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවට, නිශ්චිතව දක්වමි.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.


1A - PG 6880 — 312 (2024/09)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I වන උපලේඛනය

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර**

| | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම | අයි එෆ් සී කළම්බු 1 (පීවීටී) එල්ටීඩී (IFC COLOMBO 1 (PVT) LTD |
| 2. බලපත්‍ර අංකය | 240715226211 |
| 3. බලපත්‍රය නිකුත්කරන ලද දිනය | 2024 අගෝස්තු මස 21<br>බලපත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය. (2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 27 වන නියෝගයට අනුව) |
| 4. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | PCC00305642 |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරය |
| 6. නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සඳහා හිමිකම | IFC COLOMBO 1 (PVT) LTD සමාගම ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි. |
| 7. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2023 අගෝස්තු මස 04 වන දින අංක 2343/60 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 2 (අ) දරන නියෝගවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 8. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනා ක්‍රමය | 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 3 (1) (අ) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනා ක්‍රමය |
| 9. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක වලංගුභාවය සඳහා වූ කොන්දේසි | මෙම *ගැසට්* පත්‍රය නිකුත් කිරීමෙන් මාස හය (06)ක කාලයක් ඇතුළත කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සමඟ 1-01-02, 1-02-04 හා 1-02-05 දරන ඉඩම් කැබලි සඳහා බදු ගිවිසුමකට එළඹීමට ඉහත බලයලත් තැනැත්තා අපොහොසත් වන්නේ නම් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාර තත්ත්වය අවලංගු වනු ඇත. |

## II වන උපලේඛනය

### ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් වන IFC COLOMBO 1 (PRIVATE) LIMITED සමාගම, China Harbour Engineering Company (CHEC) සමාගමෙහි හිමිකාරීත්වය සහිත CHEC Port City Colombo (Private) Limited සමාගමෙහි අනුබද්ධිත සමාගමකි. CHEC සමාගම ප්‍රධාන ගෝලීය කොන්ත්‍රාත්කරුවෙකු වන අතර China Communications Construction Company (CCCC) සමාගමෙහි අනුබද්ධිත සමාගමකි. CCCC සමාගම Fortune Global 500 (2021) යටතේ 61 වන ස්ථානයට පත්ව ඇති අතර, ENR's 2023 යටතේ ඉහළම ගෝලීය කොන්ත්‍රාත්කරුවන් 250 අතර ලැයිස්තුගත කර ඇත. CCCC සමාගම රටවල් 145 ක ව්‍යාපාර ක්‍රියාත්මක කරන අතර, හොංකොං සහ ෂැංහයි කොටස් වෙළඳ පොලේ ලැයිස්තුගත කර ඇත.

IFC Colombo 1 (Private) Limited සමාගම පිහිටුවීමේ අරමුණ වන්නේ වාණිජ, සිල්ලර සහ නේවාසික අංගෝපාංග ක්‍රමෝපායිකව ඒකාබද්ධ කරමින්, සමෘද්ධිමත් සහ තිරසර දේපළ වෙළඳාම් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමේ දැක්මක් ඇතිව, කොළඹ වරාය නගරය තුළ දේපළ වෙළඳාම් සංවර්ධනය සිදුකිරීමයි.

IFC Colombo 1 (Private) Limited සමාගමේ ඉලක්කගත වෙළඳපොල විෂයය පථයට, 2023 අංක 1 දරන කොළඹ වරාය නගර (සංවර්ධන පාලන) නියෝගවල දක්වා ඇති පරිදි වර්ග මීටර් 12,561.60 ක් විශාල අංක 1-01-02 දරන මිශ්‍ර පරිහරණ ඉඩම් කැබැල්ල, වර්ග මීටර් 16,406.35 ක් විශාල අංක 1-02-04 දරන නේවාසික ඉඩම් කැබැල්ල සහ වර්ග මීටර් 13,945.87 ක් විශාල අංක 1-02-05 දරන නේවාසික ඉඩම් කැබැල්ල බදු දීම සහ සංවර්ධනය කිරීම මගින් දකුණු ආසියාවේ සහ ලොව පුරා සිටින ආයෝජකයින් සහ ව්‍යවසායකයින් ආකර්ෂණය කරගැනීම ඇතුළත් වේ. IFC Colombo 1 (Private) Limited සමාගම විසින් ඇ.ඩො. මිලියන 300ක් පමණ (එක් ඉඩම් කැබැල්ලකට ඇ.ඩො. මිලියන 100ක්) ආයෝජනය කිරීමට අදහස් කරන අතර, සමාගම විසින් පළමු වසර තුළ තැනැත්තන් 50 දෙනෙකු සේවයේ යෙදවීමට සැලසුම් කර ඇති අතර, සමාගමේ වෙළඳ කාර්යාලයට ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් වසර 5ක් ඇතුළත අවම වශයෙන් වර්ග මීටර් 800 ක බිම් ප්‍රමාණයක් අවශ්‍ය වේ. IFC Colombo 1 (Private) Limited සමාගමේ සංවර්ධන ව්‍යාපෘති විසින් සංචාරක ව්‍යාපාරය, නාගරික පහසුකම් සහ තාක්ෂණික දියුණුව ප්‍රවර්ධනය කිරීම, ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සහ කොළඹ වරාය නගරයේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ඉහළ නංවනු ඇත.

2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවලට හා කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන) නියෝගවලට අනුව, IFC Colombo 1 (Private) Limited සමාගම විසින් ඉඩම් කැබැල්ලකට අවම වශයෙන් ඇ.ඩො. මිලියන 100 ක් ආයෝජනයක් කිරීමේ හෝ අනුබෙදීමක් කරන ලද බිම් කැබැල්ලකට සමානුපාතික ආයෝජනයක් සිදු කිරීමේ නිර්ණායක සපුරාලනු ලබයි.

III වන උපලේඛනය

පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් |
|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | (අ) සියලු ආදායම්, ලාභ සහ බෙදාදෙනු ලබන ලාභාංශ පළමු විසිපස් වසරක කාලපරිච්ඡේදය සඳහා මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදුවලින් නිදහස් කරනු ලැබිය යුතුය.<br>(ආ) කරන ලද සියලුම ගෙවීම් පළමු විසිපස් වසරක කාල පරිච්ඡේදය සඳහා මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.<br>(ඇ) පෙර කී වසර විසිපහක කාල පරිච්ඡේදය අවසන් වීමෙන් අනතුරුව, වසර දහයක කාල පරිච්ඡේදයකට මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති දැනට ක්‍රියාත්මක ආයතනික බදු අනුපාතයෙන් 50%ක දිරිගැන්වීමක් ලබාදිය යුතු ය. |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතුය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 5. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |

| | |
|---|---|
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි මස 3 වැනි දින අංක 2282/59 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2022 අංක 1 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

## IV වන උපලේඛනය

### ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලය

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ආරම්භ වන දිනය | අවසන් වන දිනය |
|---|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 ඔක්තෝබර් 1 | 2059 සැප්තැම්බර් 30 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 5. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 ඔක්තෝබර් 1 | 2049 සැප්තැම්බර් 30 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ. | අදාළ නොවේ. |

EOG 09 - 0141

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.